**දකුණු පළාත් සභාව - 2020 වර්ෂය**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

දකුණු පළාත් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 12 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 දෙසැම්බර් 02 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2 ) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර දකුණු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දකුණු පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ------------ |
| (අ) | 2020 ජනවාරි 01 දිනට මාර්ගස්ථ ආදායම රු.115,018,220 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.89,504,271 ක් බැවින් වර්ෂය තුළ මාර්ගස්ථ ආදායමට රු.25,513,949 ක ගැලපීම් සිදුකර තිබූ නමුත් ඒ සඳහා පොදු ලෙජරයේ මාර්ගස්ථ ආදායම් ගිණුමක් නඩත්තු කර නොතිබුණි. | මාර්ගස්ථ ආදායම් සඳහා පරිගණකගත ලෙජර් ගිණුමක් අදාළ විෂයභාර නිලධාරියා මඟින් පවත්වාගෙන යනු ලබයි. | මාර්ගස්ථ ආදායම් ගිණුමක් පොදු ලෙජරය තුළ නිවැරදිව නඩත්තු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව උපචිත වියදම් රු.193,505,412 ක් වුවද ශීර්ෂ 25 ට අදාළව එම ශේෂය රු.239,469,097 ක් බැවින් රු.45,963,685 ක වෙනසක් පැවතීම නිසා උපචිත වියදම් හා වර්ෂයේ ඌනතාවය රු.45,963,685 ක් අඩුවෙන් දක්වා තිබුණි. | උපචිත වියදම්වල අගය අදාළ ආයතනවලින් ලබා ගන්නා තොරතුරු පදනම් කරගෙන අරමුදල් ගිණුමට ඇතුළත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන උපචිත වියදම් ශේෂය සහ අරමුදල් ගිණුමේ දැක්වෙන ශේෂ සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වාණිජ අත්තිකාරම් ගිණුම් 07 ක මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ක්ෂය සංචිත අරමුදල් ලෙස එකතුව රු.73,110,507 ක අගයක් දක්වා තිබුණද අරමුදල් ගිණුමෙහි එය දක්වා නොතිබීම නිසා ක්ෂය සංචිත අරමුදල් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණනයේ නිරීක්ෂණය පිළි නොගන්නා අතර පෙර වර්ෂවලදීද වාණිජ අත්තිකාරම් ගිණුම්වල හර බැර වාර්තාවේ ශේෂය පමණක් ගිණුම්ගත කර ඇත. | වාණිජ අත්තිකාරම් ගිණුම්වල දැක්වෙන ශේෂ අරමුදල් ගිණුම් සමඟ නිවැරදි විය යුතුය. |
| (ඈ) | දකුණු පළාත් සභා අරමුදල් ගිණුමේ සටහන් අංක 18 යටතේ ඇතුළත් කර තිබුණු වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු හා වාහන බලපත්‍ර ගාස්තු වල එකතුව රු.1,361,194,437 ක් වුවද මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව එය රු.1,343,184,266 ක් විය. ඒ අනුව රු.18,010,171 ක වෙනසක් පැවතුණි. | විගණනයේ නිරීක්ෂණය පිළි නොගන්නා අතර අරමුදල් ගිණුම අනුව ආදායම හා දකුණු පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම අතර වෙනසට හේතුව ලැබිය යුතු ආදායම් වේ. ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කරනු නොලැබේ. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශයේ දැක්වෙන ශේෂය හා අරමුදල් ගිණුමේ ශේෂය සැසඳීම් කර නිවැරදි කළ යුතුය. |
| (ඉ) | වැරදීම් ලෙස සටහන් වූ එකතුව රු.12,189,330 ක මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි වෙනත් ලැබීම් ලෙස දැක්වීම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙය ආදායමක් නොවන අතර ගිණුම් නිවැරදි කිරීමක් බැවින් වෙනත් ලැබීම් යටතේ දක්වා ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම් ශේෂයට ගලපා නොතිබුණු රු.120,333,153 ක් ජර්නල් සටහන් අංක 88 මඟින් සමාලෝචිත වර්ෂයේ අරමුදල් ගිණුමේ ස්ථාවර වත්කම් ශේෂයට ගැලපීමට අදාළ තොරතුරු සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සංවර්ධන වියදම් ලෙස කපා හැර තිබුණු රු.2,816,043,003 ක මූලධන වත්කම් පුනරුත්ථාපන හා | ආරම්භක ශේෂ ගැලපීමක් පමණක් සිදුකරන ලදී. කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වල අවසන් ශේෂය හා පළාත් අරමුදල් ගිණුමෙහි අවසන් ශේෂය නිවැරදි වේ. | ජ'නල් සටහන් යෙදීමේදී ඊට අදාළ තොරතුරු පැහැදිලිව පෙන්නුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැඩිදියුණු කිරීම සහ මූලධන වත්කම් අත්පත් කර ගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (උ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් අවසාන ලිපිද්‍රව්‍ය තොගය තුළ විෂය අංක 31302 දරන වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළ අවසාන තොගය වූ රු.209,164,862 ක් ඇතුළත් කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයට අදාළ අනෙකුත් සැපයුම් හා සේවා වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මෙහි තොග ගැලපීමක් පමණක් සිදුකර ඇති අතර වියදම අඩුවෙන් හෝ වැඩියෙන් දක්වා නොමැත. | වර්ෂ අවසාන ඉතිරි ලිපි ද්‍රව්‍ය තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව නිශ්චිතව තක්සේරු කළ හැකිව තිබුණු රු. 478,344,282 ක ලැබිය යුතු (හිඟ) ආදායම් ශේෂයන් 08 ක් දක්වා තිබුණද අරමුදල් ගිණුමෙහි එම ශේෂය උපචිත පදනමට හඳුනාගෙන ලැබිය යුතු ආදායමක් ලෙස දක්වා නොතිබීම නිසා වර්ෂයේ ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | සියලු ආදායම් (පොලී ආදායම හැර) රැස් කරන අවස්ථාවේදීම හඳුනාගෙන ගිණුම්ගත කරන බැවින්, ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කරනු නොලැබේ. | සමාලෝචිත වර්ෂයට අදාළ තථ්‍ය ආදායම් උපචිත පදනමට අරමුදල් ගිණුම තුළ ගිණුම් ගත කළ යුතුය. |
| (එ) | පළාත් සභාව යටතේ ඇති ශීර්ෂ 25 ට අයත් එක් එක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු දේපළ පිරියත හා උපකරණ වල 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.23,917,667,658ක් වූ අතර එදිනට පළාත් අරමුදල් ගිණුමේ දක්වා ඇති ශේෂය රු.42,289,073,491 ක් බැවින් එම ශේෂ දෙක අතර රු.18,371,405,833 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශීර්ෂ 25 න් ලබාගන්නා ලද ලිඛිත තොරතුරු අනුව අරමුදල් ගිණුමට තොරතුරු ඇතුළත් කරන ලදී. | පළාත් අරමුදල් ගිණුම හා ශීර්ෂ 25 හි දේපළ පිරියත උපකරණවලට අදාළ අගයයන් නිවැරදි කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | පළාත් අරමුදල් ගිණුමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ, දකුණු පළාතේ පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු උසාවි දඩ රු.166,580,523 ක් හා ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.1,049,220,528 ක් අඩුවෙන් දැක්වීම නිසා අරමුදල් ගිණුමේ ජංගම වගකීම් ශේෂය ඊට සමාන වටිනාකමකින් ඌන ගණනය වී තිබුණි. | පළාත් පාලන ආයතන විසින් වාර්තා කරනු ඇත්තේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් තහවුරු කිරීමට පෙර වටිනාකම වේ. එබැවින් පළාත් අරමුදල් ගිණුමෙහි සඳහන් අගය හා පළාත් පාලන ආයතන වල මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර ඇති අගයන් අතර වෙනස්කම් පැවතිය හැකිය. | අරමුදල් ගිණුමෙහි ශේෂය හා පළාත් පාලන ආයතන මූල්‍ය ප්‍රකාශන ශේෂයන් අතර පවතින වෙනස්කම් වලට අදාළ ගැලපීම් සිදු කල යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව දකුණු පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.5.1 <u>ශීර්ෂය 300 - දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය</u>

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ අකාර්යක්ෂමතා | | |
| 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 20(1) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව විසින් කලින් කලට ප්‍රඥප්ති මඟින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයන් | මේ සම්බන්ධයෙන් පවතින ගැටළු සාකච්ඡා කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පළාත් හදිසි අවස්ථා අරමුදල ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පළාත් සභා අරමුදලින් හදිසි අවස්ථා අරමුදලට ගෙවනු ලැබිය යුතුය. කෙසේ වුවද, අරමුදල ආරම්භක අවස්ථාවේදී පළාත් සභා අරමුදලින් ලබාදුන් මුදල හැර වෙනත් කිසිදු මුදලක් පළාත් සභා අරමුදලින් ලබාදී නොතිබුණි. අරමුදල් ආයෝජනයෙන් උපයන ස්ථාවර තැන්පතු පොලී ආදායම පමණක් අරමුදලේ එකම අරමුදල් ලැබීම් ප්‍රවාහය විය. | | |

1.5.2 **<u>ශිර්ෂය 304 - දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන, ප්‍රවාහන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සංචාරක සහ ඉංජිනේරු සේවා අමාත්‍යාංශය</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අපේක්ෂිත ප්රතිලාභ (Out put) ලබා නොගැනීම | | |
| අමාත්‍යාංශය විසින් දකුණු පළාත තුළ වැසිකිළි පහසුකම් නොමැති පවුල් ඒකක 11,246 ක ප්‍රමාණයකින් පවුල් ඒකක 600 සඳහා වැසිකිළි ඉදිකිරීම වෙනුවෙන් 2019 වර්ෂයේදී පවුල් 493 ක් සඳහා රු.7,888,000 ක මුදලක් ගෙවීම් කර තිබුණද, වැසිකිළි නිමකිරීම සිදුකර තිබුණේ එක් ප්‍රතිලාභියෙක් පමණකි. 2020 වර්ෂය තුළ ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුන වෙනුවෙන් රු.17,152,000 ක් වියදම් කර තිබුණි. ඉන් ප්‍රතිලාභ ලැබී තිබුණේ ප්‍රතිලාභීන් 206 දෙනෙකුට පමණක් වන අතර සම්පූර්ණ වැසිකිළි නිමකිරීම සිදුකර තිබුණේ 27 දෙනෙකු පමණි. ඒ අනුව ගෙවා ඇති මුදලින් අපේක්ෂිත ප්‍රතිඵල ඉටුවී නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලද්දේ 2019/05/24 දිනදීය. ඒ අනුව 2019 ජුනි මස වැඩසටහන ආරම්භ කළ අතර, ග්‍රාමීය වැසිකිළි ඉදි කිරීම සඳහා අනුමත වූ රු.මි. 28 ක මුදලින් ප්‍රතිලාභීන් 700 දෙනෙකු සඳහා අයදුම්පත් නිකුත් කරන ලදී. රටේ පැවති මැතිවරණ වාතාවරණය නිසා මැතිවරණ කොමසාරිස්ගේ 2019.09.28 දිනැති ලිපිය මගින් වැඩසටහන තාවකාලිකව නවත්වන ලෙස දැනුම් දීම හේතුවෙන් අදාළ ප්‍රගතිය ලගා කරගත නොහැකි විය. | ව්‍යාපෘති නිසි පරිදි ඉටුකර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.2.1 **<u>රුහුණු සංචාරක කාර්යාංශය</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අපේක්ෂිත ප්‍රතිලාභ (Out put) ලබා නොගැනීම | | |
| රුහුණු සංචාරක කාර්යාංශයේ මදුනාගල ව්‍යාපෘතියේ උණුදිය උල්පත් ජලය යොදාගෙන පාද සම්භාහනය කිරීම සඳහා රු.1,979,625 ක් වැයකර ඉදිකර තිබුණු අඩි 30X10 තරම් වූ ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් අවසන් කර නොතිබුණු අතර අත්තිවාරම් සහ කණු පමණක් ඉදිකර තිබීම නිසා ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණු බැවින් රු.1,979,625 ක වියදම නිෂ්ඵල වියදම් බවට පත් වී තිබුණි. | මෙම ස්ථානයේ පවතින ගොඩනැගිලි ආකෘතියට ගැළපෙන පරිදි ඉදිකිරීම් කටයුතු ස්වභාවය වෙනස් කිරීම හේතුවෙන් එම වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් වී නොමැති බැවින් ඉදිකිරීම් කටයුතු ඇනහිට ඇත. 2021/2022 සංවර්ධන සැලැස්මෙන් ප්‍රතිපාදන වෙන් කර මෙම කර්මාන්තය නිමා කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. | ව්‍යාපෘතිය අවසන් කර අපේක්ෂිත අරමුණ ඉටුකර ගත යුතුය. |
| (ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් | | |
| රුහුණු සංචාරක කාර්යාංශය විසින් මදුනාගල ව්‍යාපෘතිය යටතේ රු.41,452,679 ක් වියදම් කර ඉදිකරන ලද ආපනශාලාව, විවේකාගාරය හා භෝජනාගාරය භාවිතයට නොගෙන නිෂ්ක්‍රීය තත්ත්වයේ පැවතුණු අතර සංචාරක බංගලාව සඳහා ලබාදී තිබුණු රු.837,000 ක් වටිනා විදුලිජනක යන්ත්‍ර 03 ක් ද අක්‍රීය තත්ත්වයේ පැවතුණි. තවද 2007 වර්ෂයේ රු.1,306,910 ක් වියදම් කර ඉදිකළ ගැමි කඩමණ්ඩියේ ඉදිකිරීම් කිසිවක් හඳුනාගත නොහැකි පරිදි නටඹුන් පමණක් ඉතිරිවී තිබුණි. එමෙන්ම ගැමි ගම්මානයේ රු.2,718,744 ක් වියදම් කර ඉදිකරන ලද සංචාරක නිවාස 04 හි සෙවිලි තහඩු ගැලවී නිවාස විනාශ වී තිබුණි. | 2021 වර්ෂයේ දී එය ප්‍රතිසංස්කරණය කර දේශීය සංචාරකයින්ගේ අවශ්‍යතාවය සඳහා භාවිතයට ගැනීම සඳහා සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දිස්ත්‍රික් ඉංජිනේරු හම්බන්තොට මඟින් ඇස්තමේන්තු සකස් කර සංචාරක අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.ඒ අනුව 2021 වර්ෂය අවසානයට පෙර එය සංචාරක පහසුකමක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ වත්කම් නිසි පරිදි අලුත්වැඩියා කර ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.2.2 **<u>දකුණු පළාත් සංවර්ධන අධිකාරිය</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **කළමනාකරණ අකාර්යක්ෂමතා** | | |
| දකුණු පළාත් සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද දකුණු පළාත් ව්‍යවසායකත්ව දිරිබල සංවර්ධන ණය ව්‍යාපෘතිය (Southern Province Entrepreneurship Encouragement Development Loan Project) යටතේ 2020 ඔක්තෝබර් 31 දිනට හිඟ ණයලාභීන් 282 ක් වූ අතර මුළු හිඟ ණය මුදල රු.23,371,333 ක් විය. මේ අතරින් අවුරුදු 01 ට වැඩි හිඟ ණය ප්‍රතිලාභීන් 60 දෙනෙකුගෙන් අයවිය යුතු ණය මුදල රු.10,305,929 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදීත් එම මුදල නිරවුල් කර ගෙන නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොමැත. | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.3 **<u>ශීර්ෂය 305 - දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **කළමනාකරණ අකාර්යක්ෂමතා** | | |
| (අ) 2020 මැයි 28 දිනැති අංක අමප/20/0554/213/028 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙහි අංක (i) (අ) ට අනුකූල නොවී අම්බලන්ගොඩ දිසා රෝහලේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී 2020 ජුනි 25 වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසුවද ආයතන ප්‍රධානියා ලෙස සේවය කරමින් තිබුණි. | ආයතන ප්‍රධානියෙකු වශයෙන් වෛද්‍ය නිලධාරීන් පත්කිරීම ඔවුන්ගේ ජොෂ්ඨත්වය සහ ස්ථානමාරුවීම් යටතේ රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදුකරයි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් කැබ් රථයක් 2019 මාර්තු 29 දින අනතුරට පත්වී තිබුණි. එම අනතුර පිළිබඳ සිදුකළ මූලික විමර්ශන වාර්තාව අනුව හා 2020 මාර්තු 17 දිනැති ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ලබාදී තිබුණු නිර්දේශ වූයේද අනතුර සිදුවන අවස්ථාවේ රිය පැදවූ රියදුරු වගකිව යුතු බැවින් සිදුවූ හානිය වන රු.284,626 ක් ඔහුගෙන් අයකිරීමටත් අනතුරෙන් පසුව මෙම කැබ් රථය පැදවීම හේතුවෙන් එන්ජිමට සිදුවූ හානිය වන රු.254,337 ක මුදල අදාළ රියදුරු ගෙන් අයකිරීමට නිර්දේශ කර තිබුණද විගණිත දිනය වූ 2020 නොවැම්බර් 30 දින දක්වාම අයකරගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් ත්‍රිපුද්ගල පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව කටයුතු කර ඇත. | මූලික විමර්ශන වාර්තාවට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.4 **<u>ශීර්ෂය 307 - දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව</u>**

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ----------------------- | | -------------------------------- | ------------ |

ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු
---------------------------------------------------------

| | | | |
|---|---|---|---|
| (අ) | ආයුර්වේද නිෂ්පාදන අත්තිකාරම් ගිණුමේ (විෂයය අංක 30702) ලැබීම් වල බලය දෙනු ලැබූ අවම සීමාව රු.60,000,000 ක් වුවද ලැබීම් වල තථ්‍ය අගය රු.52,412,730 ක් වූයෙන් ලැබීම් වල අවම සීමාවට රු.7,587,270 කින් ලගා වී නොතිබුණි. | වසර අවසානයේ සමස්ත ආයුර්වේද රෝහල්වලට නිකුත් කළ ඖෂධ ප්‍රමාණය අඩු වීම හේතුවෙන් අපේක්ෂිත ආදායම අඩු වීම නිසා හර ශේෂයේ උපරිම සීමාව ඉක්ම විය. කෙසේ නමුත් ඉදිරියේදී මෙසේ සිදු නොවීමට වගබලා ගෙන ඇත. | සීමා ඉක්මවා යාමට පෙර අවශ්‍ය සීමා සංශෝධනයන් සිදු කර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී ආයුර්වේද නිෂ්පාදන අත්තිකාරම් ගිණුමේ අනුමැතිය ලබා දී තිබුණු වියදමේ උපරිම සීමාව රු.161,775 කින් ඉක්මවා තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය. | වසර අවසානයේ සමස්ත රෝහල්වලට නිකුත් කල ඖෂධ ප්‍රමාණය අඩු වීම හේතුවෙන් අපේක්ෂිත ආදායම අඩු වීම නිසා හර ශේෂයේ උපරිම සීමාව ඉක්ම විය. කෙසේ නමුත් ඉදිරියේදී මෙසේ සිදු නොවීමට වගබලා ගෙන ඇත. | වාණිජ අත්තිකාරම් ගිණුම්වල බලය දෙනු ලැබූ සීමා අනුව කටයුතු කළ යුතුය. යම් හෙයකින් සීමාව ඉක්මවීමක් පෙනී යන්නේ නම් අවශ්‍ය සීමා සංශෝධනයන් සිදු කරවා ගත යුතුය. |

1.5.4.1 **<u>බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදනාගාරය</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බෙලිඅත්ත ඖෂධ නිෂ්පාදනාගාරයේ ජීව වායු ඒකකයක් ඉදිකිරීමට දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය හා හෙල්පෝ ඉකෝ ග්‍රීන් සමාගම 2013 අගෝස්තු 21 දින ගිවිසුමකට එළඹ තිබුණි. කර්මාන්තය නිමකළ බව සහතික කර 2014 පෙබරවාරි 21 දින රු.792,000 ක් ගෙවීම් කර තිබුණ නමුත් එය 2015 පෙබරවාරි 21 දිනෙන් පසු ප්‍රයෝජනයට ගත නොහැකිව අක්‍රියව තිබුණි. | ඖෂධ නිෂ්පාදනයේදී ජීව වායු ගෑස් උඳුන් භාවිතය අසාර්ථක වීම මත Helpo ආයතනය සමඟ සාකච්ජා කර එය වැඩිදියුණු කිරීම සඳහා මූලික කටයුතු සිදුකර ඇත. | ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් ඉටුකරවා ගෙන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.5 **<u>ශීර්ෂය 308 - දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන මහා මාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය</u>**

1.5.5.1 **<u>දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ගිණුම්කරණ අඩුපාඩු | | |
| (i) දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ තක්සේරු වටිනාකම රු.65,010,000 ක් වූ ඉඩම් සහ රු.35,800,000 ක් වූ ගොඩනැගිලි 1993 වර්ෂයේ සිට අධිකාරිය විසින් භාවිතා කරනු ලැබුවද,අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ එම වටිනාකම් ඇතුළත් කර නොතිබුණි. ඒ හේතුවෙන් අධිකාරියේ ශුද්ධ වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් අරමුදල් ගිණුමේ අරමුදල් ආයෝජන වටිනාකමද එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි. | අධිකාරියට හිමිකමක් නොමැති බැවින් වටිනාකම් ප්‍රභවයන් ගිණුම්වලට ගෙන නොමැති බව කාරුණිකව දන්වමි. | අදාළ පවරාගැනීම් සිදුකර වත්කම් තක්සේරු කර නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ii) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණු කාපට් නිෂ්පාදන යන්ත්‍රයෙහි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. හිමිකරුගේ අවසරයක් නොමැතිව පෞද්ගලික ඉඩමක මෙම යන්ත්‍රය සවිකර තිබුණි. එම යන්ත්‍රයෙන් කාපට් නිෂ්පාදනය කිරීම 2018 අගෝස්තු සිට | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රදානය කරන ලද කාපට් නිෂ්පාදන යන්ත්‍රාගාරයෙහි වටිනාකම නිවැරදිව ලබාගැනීමේ අපහසුව හා ස්වාධින වෘත්තීය තක්සේරුවක් ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් එහි වටිනාකම ගිණුම්වලට ගැනීමට නොහැකි විය. | කාපට් නිෂ්පාදන යන්ත්‍රය නිසිලෙස ගිණුම්ගත කර අධිකාරියේ භූමියක සවිකළ යුතු අතර එය නිසි පරිදි උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2020 සැප්තැම්බර් දක්වා නතර කර තිබුණද, එම කාලය තුළ මුරකරුවන්ට අතිකාල හැර රු.2,645,139 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. | | |
| (iii) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් එකතුව රු.74,999,565 ක් වූ ණයගැති ශේෂ 04 ක් සහ රු.276,084,492 ක් වූ ණයහිමි ශේෂ 03 ක් දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන අතර, ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ අදාළ ලැබිය යුතු අංශ සමඟ සාකච්ඡා කර කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරමි. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින ණයගැති ශේෂ කඩිනමින් නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුයි. |
| (iv) | එකතුව රු.13,135,482 ක් වූ ශේෂ 04 ක් වර්ෂ ගණනාවක සිට ලැබිය යුතු ශේෂ වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අතර, ඒවා අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | බාහිර ආයතනවලින් අයවීමට ඇති මෙම ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | දීර්ඝ කාලයක් තිස්සේ පවතින ලැබිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුයි. |
| (v) | 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පවතින එකතුව රු.20,575,082 ක ටෙන්ඩර් තැන්පතු ශේෂ 208 ක් හා එකතුව රු.56,771,198 ක රඳවා ගැනීම් ශේෂ 835 ක් නිරවුල් කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් හා සැපයුම් කරුවන් දැනුවත් කරන ලෙස විෂය නිලධාරියාට දැනුම් දුන් බවත් සුදුසු පරිදි මෙම ශේෂ ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බවත් දන්වමි. | ටෙන්ඩර් තැන්පතු හා රඳවා ගැනීම් නොපමාව නිරවුල් කළ යුතුයි. |
| (vi) | චෙක්රෝල් කම්කරු වැටුපෙන් රඳවාගත් සියයට 3 ක කම්කරු රඳවා ගැනීම් කම්කරුවා සේවයේ යොදවා ගත් කාර්ය නිම කිරීමෙන් පසු නැවත ගෙවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,241,748 ක් වූ කම්කරු රඳවා ගැනීම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් වාර්තාවක් ලබාගෙන ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. | මෙම ශේෂ කඩිනමින් නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

(ආ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | ගලගොඩ ස්ථාපිත කරන ලද ගල්තාර අංගනයේ නිෂ්පාදන කටයුතු 2018 ජූලි 09 වැනි දින සම්පූර්ණයෙන් නවතා දමා තිබුණු අතර, කාපට් නිෂ්පාදන යන්ත්‍ර 2020 සැප්තැම්බර් 09 විගණිත දින දක්වාම භාවිතයට නොගැනීමෙන් දිරාපත් වෙමින් පැවතුණි. මෙම ගල්තාර නිෂ්පාදනය නතර කර දැමීම නිසා මෙම යන්ත්‍ර සමඟ ආනයනය කරන ලද ගල්තාර ඇඹරුම් යන්ත්‍ර 02 ක් හා සනවත් කරන යන්ත්‍ර 02 ක් උඩුකාව යාන්ත්‍රික අංශයේ ගාල් කර නිෂ්කාර්යව තිබුණි. | විකිණීම සඳහා කටයුතු සූදානම් කර ඇත. යන්ත්‍රාගාරය අධි ධාරිතාවයෙන් යුක්ත වීම නිසා අවම ධාරිතාවයද අවශ්‍යතාවය ඉක්මවන බැවින් හා මාර්ග නඩත්තු හා වැඩිදියුණු කිරීම සඳහා වූ ප්‍රතිපාදන අඩුවීම මත කාපට් නිෂ්පාදනය නතර කිරීම සිදු කරන ලදී. | යන්ත්‍ර අපහරණය කළ යුතුය. නොගැලපෙන යන්ත්‍රයක් මිලදී ගත් අයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | වර්ෂ 2011-2015 කාල පරිච්ඡේදය තුළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් මාර්ග කාපට් කිරීම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දී තිබුණු යන්ත්‍ර 14 ක් නිෂ්කාර්යව යාන්ත්‍රික අංශයේ ගාල් කර තිබුණු අතර ගාල්ල ප්‍රධාන කාර්යාලය ඉදි කිරීමට ගෙනෙන ලද ද්‍රව්‍ය හා උපාංග 166 ක් 2001 වර්ෂයේ සිට යාන්ත්‍රික ඉංජිනේරු ආයතනයේ සේවක විවේකාගාරයේ නිෂ්කාර්යව ගොඩගසා තිබුණි. එමෙන්ම ගල්තාර නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකාරවීම සඳහා භාවිතා කර තිබුණු විදුලි ජනක යන්ත්‍ර 02 ක් 2018 ජූලි මස සිට 2020 ඔක්තෝබර් 09 විගණිත දින දක්වාම භාවිතයට ගෙන නොතිබුණි. | යන්ත්‍ර 02 ක් ඇල්පිටිය හා අළුත්වැව පෙරමුසු යන්ත්‍ර පරිශ්‍රයේ සේවා සඳහා යොදවා ඇත. එක් යන්ත්‍රයක් වෙන්දේසි කර ඇත. වාහන 02 ක් ඇස්පෝල්ට් නිෂ්පාදනය සඳහා උණු තාර ප්‍රවාහනය සඳහා භාවිතා කරයි. අනෙකුත් යන්ත්‍ර ඇස්පෝල්ට් නිෂ්පාදනය හා ඒවා මාර්ග වල ඇතිරීම සඳහා සම්බන්ධ වන යන්ත්‍ර වේ. ද්‍රව්‍ය අතුරින් ප්‍රයෝජනයට ගතහැකි අයිතමයන් අවශ්‍යතාවය පරිදි ප්‍රයෝජනයට ගෙන ඇත. තවදුරටත් ඉතිරිවී ඇති ද්‍රව්‍ය දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනෙකුත් කාර්යාලවලට පරීක්ෂා කර බලා ලබා ගන්නා ලෙස දන්වා ඇති අතර ඉතිරි ද්‍රව්‍ය කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරමි. | යන්ත්‍ර හා උපාංග නිෂ්කාර්යව පැවතීම අවම කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා

| | | | |
|---|---|---|---|
| (i) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු සම්බන්ධයෙන් දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති අංශයේ සහාය ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා 2019 හා 2020 අගෝස්තු 20 දක්වා කාල පරිච්ඡේදය තුළ පුද්ගලික නීතිඥවරුන්ට රු.559,000 ක මුදලක් ගෙවීම් කර තිබුණි. | මෙය නිවැරදි කර ඇති අතර මේ වන විට ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති නිළධාරී මගින් අදාළ නෛතික කටයුතු සඳහා උපදෙස් ලබාගැනීම සඳහා යොමු කර ඇත. | පළාත් සභාව තුළ සිටින රජයේ නීතීඥයින් නඩු කටයුතු සඳහා යොදා ගත යුතුය. |
| (ii) | අධිකාරියට එරෙහිව අධිකාරියේ සේවකයන් විසින් උසස් වීම්, දිරිදීමනා, වැටුප් වර්ධක ලබා නොදීම් සම්බන්ධයෙන් පවරා තිබුණු නඩුවලින් සමාලෝචිත වර්ෂය තුළ විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව 15 ක් වී තිබුණි. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ නීති නිලධාරියා මඟින් අදාළ නෛතික කටයුතු සඳහා උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | අධිකාරියේ පරිපාලන කටයුතු පවත්නා නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව සිදුකළ යුතුය. |

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | | |
|---|---|---|
| දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ වැලිගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල බල ප්‍රදේශයට අයත් 2017 ගංවතුර ආපදා හේතුවෙන් හානියට පත් වූ මාර්ග නැවත ප්‍රතිසංස්කරණය කිරීම යටතේ 2017 වර්ෂයේ ආරම්භ කළ එහෙත් මෙම ව්‍යාපෘතියට අදාළ මුදල් නොලැබීම හේතුවෙන් එකතුව රු.38,733,887 ක ට ගිවිසුම්ගතවූ ඉදිකිරීම් කර්මාන්ත 07 ක මූල්‍ය ප්‍රගතිය සියයට බිංදුවක් විය. | මෙම මාර්ග දෙක තුළ විශාල වශයෙන් කඩකාමර කඩා නැවත සකස්කර දීම සිදු කළ යුතු විය. නමුත් කඩකාමර හිමියන්ගෙන් ඇතිවූ ගැටළු නිරාකරණය කරගැනීමට විශාල කාලයක් වැය විය. එසේම කොවිඩ් 19 වසංගතය නිසාද යම් බලපෑමක් සිදුවිය. | අදාළ මාර්ග නොපමාව ප්‍රතිසංස්කරණය කළ යුතුය. |

(ඉ) මතභේදයට තුඩු දුන් ගණුදෙනු

| | | |
|---|---|---|
| දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිටපු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරවරයා (පාලන), පරිපාලන නිලධාරි තනතුරට පත් කිරීම හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) තනතුරට උසස් කිරීම 2006 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව සිදුකර තිබුණි. එමෙන්ම අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරක් නොතිබියදීත් හා පරිපාලන නිලධාරී තනතුරෙහි සේවය ස්ථිරකර නොතිබියදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරෙහි වැඩ බැලීම සඳහා පත් කර තිබුණි. ඒ අනුව එම තනතුරු සඳහා | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරට පත්කර ඇති අතර පසුව ගිණුම්කාරක නියෝගය අනුව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරේ සිට සහකාර කළමනාකරු (පාලන) තනතුරේ පිහිටුවීමට තීරණය කරන ලද නමුත් ඔහු එය ප්‍රතික්ෂේප කර සේවයෙන් ඉල්ලා අස්වී ඇත.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය හා පාලන) තනතුරක් ඇති | දකුණු පළාත් සභා අරමුදල් හා ගිණුම් කාරක සභා තීරණය ක්‍රියාත්මක කළ යුතුය . |

| | | |
|---|---|---|
| ගෙවා තිබුණු වැටුප් හා දීමනා ආපසු අය කිරීමට කටයුතු කළ යුතු බවත්, 2018 දෙසැම්බර් 17 දින පැවති දකුණු පළාත් සභා අරමුදල් හා ගිණුම්කාරක සභාව තීරණය කර තිබුණද, එම තීරණ ක්‍රියාත්මකවී නොතිබුණි. | බැවින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) තනතුරක් සඳහා අනුමැතිය ලබාගෙන නැත. කාර්යමණ්ඩලයට රාජකාරී පැවරීම පමණක් සිදුකර ඇත. වැටුප් රහිත සේවා කාලයට අදාළ වැටුප් වර්ධක ගෙවීම රෙගුලාසි වලට පටහැනි වන්නේ නම් එම වැටුප් වර්ධක අඩු කිරීමටත්, වැඩිපුර ගෙවූ මුදලක් වේ නම් එම මුදල නැවත අයකර ගැනීමටත් කටයුතු කරමි. | |

(ඊ) කාර්ය මණ්ඩල පරිපාලනය

| | | |
|---|---|---|
| දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 17 න් තනතුරු 07 ක රාජකාරී ඉටු කිරීම වැඩබැලීමේ පදනම මත පත්කළ නිලධාරීන් විසින් සිදු කරමින් පැවති අතර, එය අධිකාරියේ පාලනය හා කාර්යය ප්‍රතිඵල කෙරේ අයහපත් ලෙස බලපා තිබුණි. | වැඩබැලීමේ පත් කිරීම් හේතුවෙන් අධිකාරියේ පාලනය හා කාර්ය ප්‍රතිඵල කෙරෙහි අයහපත්ව බලපා ඇති බව පිළිගත නොහැකි බවත්, වැඩ බැලීමේ තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම සඳහා 2021 අප්‍රේල් 28 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු බවත් ඒ අනුව ඉදිරියේදී නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන බවත් දැනුම් දෙමි. | ඇබෑර්තු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |

(උ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | | |
|---|---|---|
| දම්පහල උඩුගම මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ අදියර II සඳහා රු.2,290,887ක අත්තිකාරමක් 2017 දෙසැම්බර් 26 දින ගෙවා තිබුණි. ගිවිසුම පරිදි කොන්ත්‍රාත්තුව නිම කර නොතිබුණද, අධිකාරිය කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලබාදී ඇති අත්තිකාරම් මුදල් බිල්පත්වලින් අයකරගන්නා ලද අතර, තවදුරටත් ඉතිරි වී ඇති මුදල් අදාළ කොන්ත්‍රාත්කරු විසින් ගංවතුරින් හානි වූ මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව ඉදිරිපත්කර ඇති බිල් වලින් අයකර ගැනීමට කටයුතු කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව අදාළ කාර්යයන් ඉටුකරවා ගැනීමට කටයුතු කළ යුතුය. එසේ නැතහොත් සිදුවී ඇති අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකළ යුතුය. |

(ඌ) ප්‍රසම්පාදනය

| | | |
|---|---|---|
| ඇල්පිටිය මායිම්තැන්න කෘෂිකර්ම අධිකලාපයේ භූමිය සකස් කිරීම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා තිබුණද අදාළ ප්‍රසම්පාදනයන්ට පෙර ස්කැවේටර් යන්ත්‍රයක් දින 05 ක් එම අධිකලාප භූමියේ අක්කර 03 ක පමණ | වර්ග මීටර් 300 ක පමණ ප්‍රදේශයක භූමිය හෙළි පෙහෙළි කර තිබීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ඉංජිනේරුවරයා නොදන්නා බව ප්‍රකාශ කළ බවත්, | නිසි පරිදි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ප්‍රසම්පාදනයන් කළ යුතුය. |

| | |
|---|---|
| භූමි ප්‍රදේශයක් සකස් කිරීමේ කටයුතුවල යොදවා ගෙනතිබුණි. | මෙම සිදුවීම පිළිබඳ ආයතනික පරීක්ෂණයක් සිදුකළ නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිම තොරතුරක් ලබා ගැනීමට නොහැකි වූ බවත්, තොරතුරු වසන් කිරීම මඟින් වරදක් සිදුකර ඇති ඇල්පිටිය ප්‍රාදේශීය ඉංජිනේරු වරයාට අධිකාරියේ විනය කාර්ය පටිපාටිය අනුව දඩුවම් ලබාදී ඇති බවත් දන්වමි. |

(එ) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන් දීමේ නිලධාරියගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | -------------------------------------- | -------------------- | ------------------- | ---------- |
| (i) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ xvii වැනි පරිච්ඡේදයේ 184 වන වගන්තිය | 2020 පෙබරවාරි 25 දිනැති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිගේ ලිපිය මඟින් සේවකයින් 04 දෙනෙකු වැඩ පරිපාලක තනතුරු වලට පත්කර 2020 මාර්තු සිට ජුනි දක්වා රු.649,760 ක වැටුප් ගෙවා තිබුනි. | එම සංශෝධනයන් බඳවා ගැනීමේ පරිපාටියට ඇතුළත් කිරීමට හා ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | අංක 1589/30 දරන 2009 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2016 අප්‍රේල් 19 දිනැති දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය | පටිපාටියට පටහැනිව සුදුසුකම් සපුරා නොතිබුණු අයදුම්කරුවන් දෙදෙනෙකු දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරට උසස් කර 2019 සැප්තැම්බර් 09 දින පත්වීම් ලබා දී තිබුණි. | පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීම, පරිවාස කාලය අවසන් වූ සේවකයන් වෙත ස්ථිර තත්ත්වය ප්‍රධානය කිරීම වැනි කටයුතු අප්‍රමාදව සිදු කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම සිදුකර ඇති අතර, ඉදිරියේදී මෙවැනි අතපසු වීම නොවීමට ක්‍රමවේදයන් සකස් කර ඇත. | සිදුකර ඇති වරද නිවැරදි කිරීම හා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.6 **<u>ශීර්ෂය 309 - දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------- | ------------ |
| කළමනාකරණ අකාර්යක්ෂමතා<br>------------------------------------- | | |
| දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයෙන් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණු කැබ් රථ 02 ක අයිතිය 2021 පෙබරවාරි 12 දින වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන ලේකම් හරහා ඉදිරියේදී පැවරීම් කටයුතු සිදුකර ගැනීමට කටයුතු කරමි. | කැබ් රථ 02 හි අයිතිය පවරා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. |

1.5.7 **<u>ශීර්ෂය 310 - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------- | ------------ |

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

| | | | |
|---|---|---|---|
| (i) | දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පාසැල්වල කිසිඳු කාර්යයක් සිදු නොකර, වැටුප් ලබමින් සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව 84 ක් විය. | කිසිඳු කාර්යයක් සිදු නොකරන රෝග තත්ත්වයෙන් පෙළෙන ගුරු භවතුන් සම්බන්ධ තොරතුරු දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති බව වාර්තා කර තිබුණි. | ගුරුවරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ ප්‍රමාණවත් වෛද්‍ය වාර්තා ලබාගෙන සුදුසු පරිදි කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | දකුණු පළාතේ කලාප 05 කට අයත් පාසැල් 128 ක ගුරුවරුන් 205 දෙනෙකු වෙත ඔවුන්ගේ පත්වීම් විෂයයට අදාළ ඉගැන්වීමේ කටයුතු පැවරීමකින් තොරව කාර්යාලය කටයුතු, පාසැල් අධීක්ෂණය, පුස්තකාල හා ගබඩා කටයුතු වැනි පාසලේ වෙනත් කාර්යයන් පවරා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ගුරුවරුන් පාසල්වල ඉගැන්වීම් කටයුතුවල යෙදවිය යුතුය. |
| (iii) | අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයට කලාපයේ පාසැල් සම්බන්ධයෙන් ලද පැමිණිලි 08 කට අදාළව කමිටු පත්කර වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණද, පරීක්ෂණ අවසන් කර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට මූලික විමර්ශන වාර්තා 02 ක් ලැබී ඇති අතර, අනෙකුත් වාර්තා මේ වන විටත් ලැබී නොමැති බවත් ඉදිරියේදී කඩිනමින් මූලික විමර්ශන වාර්තා ලබා ගැනීම සඳහා කටයුතු කරමි. | නියමිත කාලය තුළ විමර්ශන වාර්තා ලබා නොදුන් පරීක්ෂණ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයන් ගත යුතුය. |

(ආ) මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | | |
|---|---|---|
| අම්බලන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය ප්‍රධාන මෙහෙයුම් කොට්ඨාශ 04 ක් යටතේ ක්‍රියාත්මක වීමට අනුමතව තිබුණද, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල 03 ක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි. එමෙන්ම කලාප කාර්යාලය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අතිරික්තව සහකාර අධ්‍යක්ෂවරු 06 දෙනෙක් යොදවා නියමිත රාජකාරියක් නොමැතිව වැටුප් ගෙවා තිබුණි. | මේ සම්බන්ධව 2021.01.21 දින පවත්වන ලද පළාත් ප්‍රගති සමාලෝචන රැස්වීමේදී පළාත් අධ්‍යාපන ලේකම් දැනුවත් කර ඇත. ස්ථානමාරු වීම හා උසස් වීම ක්‍රියාත්මක වූ පසු අතිරික්තතාවයක් ඇති නොවේ. | අනුමත කළ පරිදි කොට්ඨාස අධ්‍යාපන කාර්යාල පිහිටුවීමට කටයුතු කර පාසල් අධ්‍යාපන කටයුතු ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. එමෙන්ම අතිරික්ත කාර්ය මණ්ඩලයේ හයදෙනා ඒ සඳහා මුදාහළ යුතුය. |

(ඇ) පාසල්වල ගුරු ඌනතා හා අතිරික්තතා

| | | | |
|---|---|---|---|
| (i) | ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ කොට්ඨාශ 5 හි පාසැල්වල ගුරු ඌනතා හා අතිරික්තතා සැලකීමේදී ප්‍රාථමික හා ද්විතියික විෂයයන් සඳහා ගුරුවරුන් 196 ක ඌනතාවයක් හා 133 ක අතිරික්තයක් පැවතුණි. | 196 හා 133 ක ඌනතා හා අතිරික්ත ගුරුවරුන් අවශ්‍යතාවය පරිදි ඌනතාවයන් සපුරා ගැනීම පිණිස අතිරික්ත ගුරුවරුන් යොදා ගැනීමට කටයුතු කර ඇත. | අතිරික්ත ගුරුවරුන් මුදා හැරීමටත් ඌනතාවයන් සම්පූර්ණ කර ගැනීමටත් නොපමාව ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මාතර කලාපයේ විදුහල්පති ශ්‍රේණිධාරීන් 36 ක අතිරික්තයක් පැවතියදී පාසැල් 07 ක ගුරු සේවයේ ගුරුවරුන් විදුහල්පති තනතුරේ වැඩ බැලීමට පත්කර තිබුණි. | මාතර අධ්‍යාපන කලාපය තුල අතිරික්ත විදුහල්පති ශ්‍රේණිධාරීන් 36 ක් සිටියදී වැඩබලන විදුහල්පතිවරුන් 09 දෙනෙකු සේවය කිරීම පිළිබඳ උපදෙස් ඉල්ලා 2021.04.22 දිනැතිව දකුණු පළාත් අධ්‍යාපන ලේකම් වෙත ලිපියක් යොමුකර තිබුණි. | වැඩ බලන විදුහල්පති 07 දෙනා වෙනුවට විදුහල්පති ශ්‍රේණිධාරීන් 07 දෙනෙකු පත්කර තවදුරටත් අතිරික්ත පිරිස වෙනත් කලාප සඳහා මුදාහළ යුතුය. |

(ඇ) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2016 අගෝස්තු 26 දිනැති අංක 04/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5.4 හා 5.4.1 වගන්තිය | ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය පදිංචිව සිටින සී.ඩබ්.ඩබ්.කන්නංගර විදුහලේ නිල නිවස 2019 පෙබරවාරි 15 දින වන විට රු.2,692,971 ක මුදලක් වැයකර සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර තිබිය දී ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5.4 හා 5.4.1 වගන්ති වලට අනුකූල නොවන පරිදි මසකට රු.2,000 ක් බැගින් වූ ආර්ථික කුලියක් පමණක් අය කරමින් පැවතුණි. | ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5.6 වගන්තියට අනුව ලේකම්ගේ අනුමැතිය මත කටයුතු කළ අතර, රා.පරි.චක්‍රලේඛ 04/2016 අනුව ඉදිරියේ දී කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කුලී අයකළ යුතුය. |

1.5.8 **<u>ශීර්ෂය 311 - ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන, පරිසර කටයුතු, ග්‍රාමීය කර්මාන්ත, විදුලිබල සහ ග්‍රාමීය වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අපේක්ෂිත ප්‍රතිලාභ (**Out come**) ලබා නොගැනීම | | |
| අමාත්‍යාංශය යටතේ පවතින රිදියගම මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකය සංවර්ධනය සඳහා ප්‍රධාන ලේකම්ගේ නම්‍යශීලි අරමුදල සහ විශේෂ ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.5,356,167 ක ප්‍රතිපාදන අනුමත කර ගෙන 2020 දෙසැම්බර් 31 දින වන විට රු.4,344,239 ක මුදලක් වියදම් කර තිබුණද ව්‍යාපෘතිය සම්පූර්ණ නොකිරීම මත ව්‍යාපෘතියේ අරමුණු ඉටුවී නොතිබුණි. අදාළ වියදම අනුව ප්‍රතිලාභ ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | රිදියගම මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකකයේ දෙවැනි අදියර වශයෙන් රු.5,356,167 ක මුදලක් නම්‍යශීලී අරමුදල හා විශේෂ ගම්මාන ව්‍යාපෘතිය යටතේ අනුමත කර ඇත. 2021 වර්ෂයේ ද කාර්මික සංවර්ධන අධිකාරිය වෙතින් ප්‍රතිපාදන යොදවා ව්‍යාපෘතියේ අවසාන සියලු කටයුතු නිමවීමෙන් අනතුරුව අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට සුදුසු තත්ත්වයට ව්‍යාපෘතිය පත් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු වෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | අදාළ කාර්ය නිම කර යෝජිත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

1.5.8.1 **<u>දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රිදියගම මත්ස්‍ය නිෂ්පාදන ඒකකය, තලුන්න ගොවිපල හා බෝගහපැලැස්ස අලෙවි පියස මධ්‍යස්ථානවල නීත්‍යානුකූල හිමිකමක් අධිකාරිය සතුව නොතිබුණද, අධිකාරිය විසින් පසුගිය වර්ෂ කිහිපයේදීත් සමාලෝචිත වර්ෂයේදීත් වියදම් දරා ආදායම් උත්පාදනය කර තිබුණි. එම මධ්‍යස්ථානවල වටිනාකම වත්කම් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | මෙම මධ්‍යස්ථාන තක්සේරු කිරීම සඳහා ඉල්ලීමක් 2020 වර්ෂයේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණු අතර මේ වන තෙක් ඒ සඳහා තක්සේරුවක් ලැබී නොමැති අතර ඉදිරි වර්ෂයන්හි තක්සේරු වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් අයිතිය තහවුරු කර ගැනීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශනවලට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගොඩනැගිලි වටිනාකම ලෙස දක්වා තිබූ ගොඩනැගිලි වලට අදාළ රු.43,721,581 ක් වටිනා ගොඩනැගිලි අයත් ඉඩම් කැබලි 05 ක් විධිමත්ව පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම රු.43,721,581 ක් වන ගොඩනැගිලි අයත් ඉඩම් වලින් අහුන්ගල්ල හා දෙනිපිටිය හැර අනෙකුත් මධ්‍යස්ථාන, අධිකාරිය වෙත කටයුතු කරගෙන යාම සඳහා පවරාදුන් ඉඩම් වේ. මෙම ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරාගැනීම සම්බන්ධව ඉදිරියේදී කටයුතු සිදුකරන බව කාරුණිකව සඳහන් කරමි. | වත්කම් පවරා ගෙන ගිණුම් ගත කිරිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය, විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන වැඩසටහන 2018 යටතේ කොහු ආශ්‍රිත බුරුසු නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.3,065,325 ක් වියදම් කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා අධිකාරිය විසින් මැෂින් 510 ක් ප්‍රතිලාභීන් වෙත බෙදා දී තිබුණු බව දක්වා තිබුණද ඉන් රු.1,003,625 ක් වටිනා කෙඳි අඹරන මැෂින් 259 ක්, රු.219,800 ක් වටිනා කොහු කපන මැෂින් 28 ක්, රු.77,000 ක් වටිනා කම්බි කපන මැෂින් 28 ක් හා රු.660,000 ක් වටිනා ට්‍රිම් මැෂින් 06 ක් බෙදාහැර ඇති බවට අදාළ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ඒ සඳහා ගෙවන ලද රු.1,960,425 ක මුදලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම යන්ත්‍ර ප්‍රජා පාදක සංවිධාන සඳහා ගිවිසුම් පත්‍රයක් මඟින් ලබා දී ඇත. | යන්ත්‍රෝපකරණ භාරගත් බවට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

1.5.9 **<u>ශීර්ෂය 312 - දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව</u>**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------- | ------------ |
| (අ) | කළමනාකරණ අකාර්යක්ෂමතා<br>----------------------------------- | | |
| | දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ නිවාස කුලී අය කිරීමේ දී ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5:4 සහ 5.4.1 වගන්ති හා | එම නිලධාරීන්ට ලබා දී ඇති රජයේ නිවාසවල පැවති අඩුපාඩු හා අවම පහසුකම් හේතුවෙන් 10% කුලිය අයකිරීමට කටයුතු කළ අතර එම නිවාස 2020 වර්ෂය අවසානයේදී | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව කුලී අයකළ යුතුය. |

| | | |
|---|---|---|
| 04/2016 හා 2016 අගෝස්තු 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කුලී අයකළ යුතු වුවත් එසේ සිදු නොකිරීම නිසා නිලධාරීන් 07 දෙනෙකුගෙන් රු.228,336 ක කුලී අඩුවෙන් අයකර ගෙන තිබුණි. | අලුත්වැඩියා කරදී ඇති බැවින් 2021 වර්ෂයේ සිට 12.5% බැගින් නිවාස කුලිය අයකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | |

(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

---------------------------

| | | |
|---|---|---|
| කැකණදුර කුකුළු ගොවිපලේ සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත කටයුතු සඳහා නළ ළිදක් ඉදිකිරීමට 2019 වර්ෂයේදී සහ 2020 සමාලෝචිත වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම මඟින් රු.1,207,933 ක් ජල සම්පාදන මණ්ඩලයට ගෙවා තිබුණද අදාළ ව්‍යාපෘතියේ වැඩ අවසන් කර අදාළ කාර්යය සඳහා යොදවා ගෙන නොතිබුණි. | කැකණදුර කුකුළු ගොවිපලේ සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත කටයුතු වලට සහ කෘෂිකාර්මික කටයුතු වලට අවශ්‍ය ජලය අඛණ්ඩව සපයා ගැනීමේ අවශ්‍යතාවය සඳහා නල ළිදක් ඉදිකිරීම අත්‍යවශ්‍යව තිබුණු කාරණයක් බැවින් 2019 හා 2020 වර්ෂයේදී රු.1,207,933 වරින්වර ජල සම්පාදන මණ්ඩලයට ගෙවා නළ ළිද සකස් කිරීමට අදාළ කටයුතු ඉටුකර ඇත. | ගිවිසුම්ගත පරිදි කඩිනමින් අදාළ ව්‍යාපෘතියේ වැඩ නිම කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

(ඇ) ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

-----------------------------------------------------------------

| | | |
|---|---|---|
| කැකණදුර කුකුල් ගොවිපළ පවත්වාගෙන යාම හා බීජ රක්නාගාර නඩත්තු අත්තිකාරම් කටයුත්තට (විෂයය අංක 31202) අදාළ ලැබීම් වල බලය දෙනු ලැබූ අවම සීමාව රු.26,300,000 ක් වුවද ලැබීම් වල තථ්‍ය අගය රු.25,815,698 ක් වූයෙන් රු.484,302 කින් ලැබීම් වල අවම සීමාවට ළඟාවී නොතිබුණි. | 2020 වර්ෂයේ මුල් භාගයේ සිටම රට තුළ පැවති හා තවමත් නොනැසී පවතින කොරෝනා රෝග තත්ත්වය (Covid -19) හේතුවෙන් අපේක්ෂිත පරිදි කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම නිසා සමාලෝචිත වර්ෂයේදී අපේක්ෂිත ලෙස අවම ලැබීම් සීමාවට ළඟා වීමට නොහැකි වූ බව කාරුණිකව දැනුම් දෙමි. | වාණිජ අත්තිකාරම් ගිණුම්වල බලය දෙනු ලැබූ සීමා අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.10 **ශීර්ෂය 315 - දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------- | ----------- |

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

| | | |
|---|---|---|
| තෙලිජ්ජවිල දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය 2018 නොවැම්බර් 09 දින රු.260,000 ක් වැයකර සුදු පොල්තෙල් | කොරෝනා වසංගත තත්ත්වය හමුවේ විදුලිය ඇස්තමේන්තුව සකසා ගැනීමට ප්‍රමාද වීම විදුලිය | වහාම යන්ත්‍රය උපයෝගී කරගෙන පොල් තෙල් නිෂ්පාදන ව්‍යාපෘතිය ආරම්භ |

| | | |
|---|---|---|
| නිෂ්පාදන යන්ත්‍රයක් මිලදීගෙන තිබුණු අතර විදුලිය සපයා නොගැනීම හේතුවෙන් විගණිත දිනය වූ 2020 දෙසැම්බර් 31 දින වන විටත් යන්ත්‍රය භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | ලබාගැනීම ප්‍රමාදයට හේතු විය. මේ වන විට විදුලිය ලබාගෙන පොල්තෙල් නිෂ්පාදනය ආරම්භ කිරීමට මූලික පියවර ගෙන ඇත. | කළ යුතුය. |

1.5.11 **<u>ශීර්ෂය 317 - දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ------------ |
| කළමනාකරණ අකාර්යක්ෂමතා<br>-------------------------------------- | | |
| (අ) 1972 අංක 15 දරන සමුපකාර සමිති පනතේ 43(ii) වගන්තිය ප්‍රකාරව විගණනය කරන ලද බල ප්‍රදේශයේ සමිති 229 ක ලාභයෙන් සමුපකාර අරමුදලට රු.194,382,122 ක මුදලක් අයවිය යුතුව තිබුණු නමුත් මෙම මුදල් අයකර ගැනීමට මාතර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු රු.207,350,590 න් රු.2,762,410 ක මුදලක් 2021 අගෝස්තු 30 දින වන විට ලැබී ඇත. | සමුපකාර සමිති පනතට අනුකූලව කටයුතු කර සමුපකාර අරමුදලට අයවිය යුතු මුදල් අයකර ගත යුතුය. |
| (ආ) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අධිකරණය විසින් ප්‍රේෂණය කරන දඩ මුදල් අදාළ සමිති වෙත කඩිනමින් ප්‍රේෂණය කළ යුතු වුවත් හඳුනා නොගත් රු.914,468 ක දඩ මුදල් ශේෂයක් 2020 දෙසැම්බර් 31 දිනට පැවතුණි. | 2021 අගෝස්තු 30 දින වන විට තවදුරටත් පවතින ශේෂය රු.899,761 කි. | උසාවි දඩ මුදල් නිවැරදිව හඳුනාගෙන අදාළ සමිති වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

1.5.12 **<u>ශීර්ෂය - 318 - ක්‍රීඩා හා යෞවන කටයුතු, ග්‍රාම සංවර්ධන , සංස්කෘතික හා කලා කටයුතු, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා ගෘහ ආර්ථික ප්‍රවර්ධන, නිවාස හා ඉදිකිරීම් සහ මිනිස් බල හා රැකී රක්ෂා අමාත්‍යාංශය</u>**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු** | | |
| අමාත්‍යාංශය යටතේ පවතින හික්කඩුව නාරිගම බහුකාර්ය සේවා මධ්‍යස්ථානය ඉදිකිරීමේ (II අදියර) කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත පරීක්ෂාවේදී දක්වා ඇති විෂයයන් 97 කින් නියැදි පරීක්ෂාවට අනුව විෂයයන් 41 ක් සඳහා ඇස්තමේන්තු කළ වටිනාකම හා සත්‍ය වටිනාකම අතර රු.5,488,162 ක අසාමාන්‍ය ඉතිරියක් නිරීක්ෂණය වූ අතර විෂයයන් 19 ක් සඳහා රු.4,633,249 ක අසාමාන්‍ය වැඩිවීමක් පැවතුණි. | සැලසුම් සංශෝධනය වීම, වෙනත් කර්මාන්තයකට මෙම වැඩ බිමේ ඉවත් කළ යුතු පස් රැගෙන යාම, දෙපස දේපළ රැකෙන පරිදි ඉදිකිරීම් සිදු කිරීම හා හානි වූ තාප්පය නැවත ඉදිකිරීම ආදිය නිසා ප්‍රමාණයන් වෙනස් විය. | කොන්ත්‍රාත් වලදී නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුය. හානි වෙනුවෙන් කොන්ත්‍රාත්කරු ගේ රක්ෂණය මඟින් වන්දි ලබා ගන්නා ලෙස දැනුම් දිය යුතුය. වැඩ බිමෙන් ඉවත් කරන පස්, දැව යනාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය. |
| **(ආ) ප්‍රසම්පාදනය** | | |
| අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී දකුණු පළාතේ ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සියයට 50 ප්‍රතිලාභී දායකත්වය යටතේ ස්වයංරැකියා උපකරණ මිලට ගැනීමේදී VAT සඳහා ලියාපදිංචිය අක්‍රීය වූ සැපයුම්කරුවකු වෙත VAT සඳහා රු.974,460 ක් ගෙවා තිබුණි. | වැට් බදු ප්‍රේෂණය කිරීම තහවුරු කරන ලෙස අදාළ ආයතනයට හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. | VAT ගෙවීමේදී සැපයුම්කරුවන් VAT සඳහා සක්‍රීයද යන්න සොයා බලා ගෙවීම් කළ යුතුය. |

## 1.5.13 **ශීර්ෂය 319 - සමාජ සුබසාධනය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම** | | |
| 2018 උපමාන පාදක සංවර්ධන සැලැස්ම යටතේ දකුණු පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.ලක්ෂ 05 ක් වෙන්කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දින සිට 2020 අගෝස්තු දක්වා රු.619,000 ක් වැයකර තිබුණු නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පවතින විවිධ තාක්ෂණික හා තාක්ෂණික නොවන ගැටළු හේතුවෙන් මෙම දත්ත පද්ධතියේ කටයුතු අඩාල වීමෙන්, ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට නොහැකි වී තිබුණි. | මෘදුකාංගය ස්ථාපනය කිරීම සඳහා මූලික පිරිවැය ලෙස රු. ලක්ෂ 05ක් වැයවූ අතර ඉතිරි මුදල වූ රු.119,000 ක් ගෙවා ඇත්තේ 2020 අගෝස්තු මස දක්වා මාසිකව අන්තර්ජාලය තුළ දත්ත ගබඩා කිරීම සඳහාය.<br>මේ සම්බන්ධයෙන් පුහුණුවීම් කටයුතු අදියර දෙකකින් සිදු කරන ලද අතර මූලික පුහුණුවීම් 2019 මාර්තු මස හා විධිමත් පුහුණුවීම 2019 ඔක්තෝම්බර් මස ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල සේවය කරන සමාජ සේවා නිලධාරින්ට හා විෂයභාර නිලධාරීන්ට ලබාදීම සිදු කර ඇත. ඉදිරියේදී ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල දැනට පවතින පරිගණක පහසුකම් වර්ධනය කර අන්තර්ජාල පහසුකම් වැඩිදියුණු කර මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට අපේක්ෂා කරයි. | ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර අපේක්ෂිත අරමුණු ළඟාකර ගත යුතුය. |

1.5.14 **ශීර්ෂය 320 - දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) විගණනය සඳහා සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම නිසා එකතුව රු.1,135,420,724 ක් වූ දේපල පිරියත හා උපකරණ විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීම ආරම්භ කොට ඇති බවත් ඉතා ඉක්මනින් එම කටයුතු අවසන් කර ලේඛනය නිසි පරිදි නඩත්තු කරන බවත් සඳහන් කර ඇත. | විධිමත් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

(ආ) හඳුනා ගන්නා ලද පාඩු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දකුණු පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා කාර්යාල වලට අයත් නොවිසඳී පවතින අවස්ථා 104 කට අදාළ රු.14,367,682 ක වාහන අනතුරු සම්බන්ධ හානි, අවස්ථා 15 කට අදාළ රු.1,459,142 ක දේපළ හානි වල එකතුව රු.15,826,827 ක් විය. | වාහන සහ දේපළ හානි සම්බන්ධව කටයුතු කිහිපයක් අවසන් කර ඇති බවත් ඉතිරි හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරමින් පවතින බවත් එමෙන්ම ඒ සඳහා නීති උපදෙස් අනුගමනය කරමින් පවති. | මු.රෙ.104 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඇ) පොදු තැන්පත් ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයට අනුව මු.රෙ 571 ප්‍රකාරව ආයතන 07 කට අයත් නියාදනය නොකළ තැන්පත් ශේෂ එකතුව රු.64,704,758 ක් විය. | ශේෂ කිහිපයක් නිරවුල් කර ඇති අතර ඉතිරිය කඩිනමින් නිරවුල් කිරීමට එකඟ වී ඇත. | කල් ඉකුත් වූ තැන්පත් පිළිබඳ මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඈ) කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | | |
|---|---|---|
| පළාත තුළ සේවය කරනු ලබන සේවකයන්ගේ වැටුපෙන් අයකරන ලද මාස 08 ක වැන්දඹු අනත්දරු අරමුදල් දායක මුදල් ප්‍රමාද වී ප්‍රේෂණය කර තිබුණු අතර තවදුරටත් ප්‍රේෂණය කළ යුතු ශේෂය ලෙස රු.220,714,592 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණි. | පළාත් අරමුදලේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් මෙය ප්‍රමාද විය. | නියමිත පරිදි අදාළ දායක මුදල් වැන්දඹු අනත්දරු අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

(ඉ) හිඟ සේවක ණය

---------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් වල එකතු ශේෂය රු.1,243,111,752 ක් ජංගම වත්කම් ලෙස දක්වා තිබූ අතර එම ශේෂයට ස්ථානමාරුවී ගිය, විශ්‍රාමගිය හා මියගිය වැඩ තහනම් කළ සේවය හැර ගිය සහ සේවයෙන් පහකළ නිලධාරීන් 918 දෙනෙකුගෙන් වර්ෂයක් ඉක්මවා අයනොවී පවතින එකතුව රු.42,950,767 ක් වූ ණය ශේෂ ඇතුළත්ව තිබුණි. | විගණනයේ නිරීක්ෂණය පිළිගනිමි. | මෙම ණයශේෂ නිරවුල් කිරීමේ කටයුතු ආයතන මඟින් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.1,654,409,455 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ නැවත ගලපන ලද ඌනතාවය රු.1,279,965,187 ක් විය. සමාලෝචිත වර්ෂයේ වැටුප් වේතන සහ අනෙකුත් ප්‍රතිලාභ යන පුනරාවර්ථන වියදම් රු.3,648,719,987 කින් වැඩිවීම සහ බදු ආදායම රු.3,238,506,505 කින් හා බදු නොවන ආදායම රු.43,829,379 කින් අඩුවීම යන ප්‍රධාන හේතූන් මත ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඌනතාවය තවදුරටත් වර්ධනය වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 රජයේ ප්‍රදාන**

| මූලාශ්‍රය | අනුමත මුදල (රු.) | වැයකළ මුදල (රු.) | ඌන උපයෝජනය (රු.) |
|---|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන (PSDG) | 905,200,000 | 862,219,835 | 42,980,165 |
| උපමාන පාදක ප්‍රදාන (CBG) | 605,330,000 | 542,481,741 | 62,848,259 |
| අධ්‍යාපනික අංශ සංවර්ධන සැලැස්ම (TSEP) | 45,000,000 | 32,553,100 | 12,446,900 |
| දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන සැලැස්ම(HSDP) | 220,642,590 | 219,306,400 | 1,336,190 |

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉහත විග්‍රහ කර ඇති පරිදි පළාත් සංවර්ධන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන වලින් සැළකිය යුතු ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණි. | තොරතුරු නිවැරදි වේ. | අනුමත ප්‍රතිපාදන පළාත් සංවර්ධන කටයුතු වෙනුවෙන් සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

---------------------------

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 1,587 ක ඇස්තමේන්තු වටිනාකමට වූ යෝජනා 1,127 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත පරිදි විය.

| විස්තරය | නව වැඩ යෝජනා ගණන | අවිච්ඡේද යෝජනා වැඩ ගණන | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| --------- | ---------- | --------- | ---------- | ------------ |
| | | | | (රු.මිලියන) |
| සම්පූර්ණයෙන් නිමකළ | 709 | 165 | 874 | 1,295 |
| සියයට 50 කට වඩා වැඩියෙන් නිමකළ | 91 | 10 | 101 | 186 |
| සියයට 50 කට වඩා අඩුවෙන් නිමකළ | 140 | 3 | 143 | 104 |
| ආරම්භ කර නොතිබුණු | 9 | - | 9 | 2 |
| | ---- | ---- | ------- | ------ |
| | 949 | 178 | 1,127 | 1,587 |
| | === | === | ==== | ==== |

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------- | ------------ |
| විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘති (අධ්‍යාපන) හා විශේෂ අංශ සංවර්ධන ව්‍යාපෘතින්ට (සෞඛ්‍ය) අදාළව දකුණු පළාත් සභාව තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය විසින් අධීක්ෂණය කර නොතිබුණු අතර එකී වැඩසටහන් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉහත සටහනට ඇතුළත්ව නොතිබුණි. එමෙන්ම වසර තුළ නිම කිරීමට සැලසුම් කළ වැඩ යෝජනාවල සියයට 14 කට ආසන්න ප්‍රමාණයක ප්‍රගතිය ඉතාමත් පහළ මට්ටමක පැවැතුණු බව නිරීක්ෂණය විය. | අදාළ අමාත්‍යාංශ වෙතින් තොරතුරු කැඳවා ඇතත් එම තොරතුරු මේ දක්වා ඉදිරිපත් නොවූ බවත් මෙම ව්‍යාපෘති ආරම්භයේ සිටම සැලසුම් අංශයෙන් අධීක්ෂණ කටයුතු සිදු වී නොමැත. | දකුණු පළාත් සැලසුම් ලේකම් කාර්යාලය විසින් දකුණු පළාත තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය කළ යුතු අතර වසර තුළ නිම කළ යුතු වැඩ අදාළ වසර තුළදී නිම කළ යුතුය. |

## 04 කාර්ය මණ්ඩල පරිපාලනය

### 4.1 පළාත් සභා ආයතනවල කාර්ය මණ්ඩල පරිපාලනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභා නිලධාරීන්ගෙන් 3,431 ක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ චක්‍රලේඛ අංක 1/2019 හා 2/2020 විධිවිධාන පරිදි කටයුතු කිරීමට සිදුව ඇති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.<br><br>කඩිනමින් සම්පූර්ණ කිරීමට අවශ්‍යා තනතුරු පුරප්පාඩු සඳහා අනුමැතිය ලබාගැනීම පිණිස කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වියදම් ශීර්ෂ 25 හි ශුද්ධ ප්‍රතිපාදන වලින් එකතුව රු.2,700,465,585 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එම අගයන් රු.903,837 සිට රු.661,905,773 අතර පරාසයක පැවතුණි. | ජේදය පිළිගනිමි. ඉදිරි අයවැයකරණ ක්‍රියාවලියේදී මේ තත්ත්වය සලකා කටයුතු කරනු ලැබේ. | අනුමත ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ යුතුය. |